# දේශපාලනඥයන් අයුතු ලෙස හම්බ කරන්නේ මනාප ක්‍රමය නිසයි



මහනුවර - කමල් සුරවීර

- විවිධ නීති විරෝධී ක්‍රමෝපායන් පවා භාවිත කරමින් අයුතු ආකාරයෙන් මුදල් ඉපැයූ පිරිස් අද දේශපාලනයට පැමිණ

සිදු කරන්නේද ජනතාවට හෝ රටට සේවයක් නොව අයුතු ආකාරයෙන් මුදල් හම්බ කිරීම පමණක් බවත් ඊට ප්‍රධාන හේතුව බවට ඇත්තේ පවතින මනාප ඡන්ද ක්‍රමය බවත් මල්වතු මහ විහාර පාර්ශ්වයේ මහ නායක තිබ්බටුවාවේ ශ්‍රී සුමංගල නාහිමියෝ පැවසූහ.

ඉදිරියේදී දේශපාලනයට පිවිසෙන්නන් උදෙසා සකස් කළ ආචාර ධර්ම පද්ධතියේ පිටපතක් මල්වතු නාහිමියන් වෙත පිළිගැන්වීම උදෙසා පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පෙරේදා (21දා) නාහිමියන් බැහැදුටු අවස්ථාවේ උන්වහන්සේ ඉහත සඳහන කළහ.

පසුගිය කාලයේ මේ රටේ දේශපාලනයට එක් වුණේ උගත්කමක් ඇති, ජනතා මුදල් ගසා කෑමේ අවශ්‍යතාව නොමැති, අවංකවම රටට, ජනතාවට ආදරය කළ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම දේශපාලනඥයන් කිව හැකි අයයි. අපි එදා අහල තිබෙනවා මේ රට දෙවරක් පාලනය කළ අග්‍රාමාත්‍යවරයෙක් මරණයට පත්වන අවස්ථාවේ එතුමාගේ බැංකු පොතේ තිබුණේ රුපියල් සීයක් වැනි මුදලක් පමණයි කියලා. මුදල් හා වෙනත් බලතල හේතුවෙන් දේශපාලනයට කිසිසේත්ම සුදුසු නැති පුද්ගලයන් ඒ තැන්වලට ගිහිල්ලයි රටට මේ විනාශය සිදු වුණේ.

මුදල් වැය කරල ගමේ ජනතාවට යම් යම් දේ දීල ඡන්දය ලබා ගැනීමේ ක්‍රමයකටයි රට පත් වෙලා තියෙන්නේ. රටේ ජනතාවට මේ සම්බන්ධයෙන් එතරම් අවබෝධයක් නැහැ. මේ තත්ත්වය අහෝසි කර රටට ජනතාවට අවංකවම ආදරය කරන දැන උගත් අවංක පුද්ගලයන් උසස් තැන්වලට යවන්න ජනතාව කටයුතු කළ යුතු බවද නාහිමියෝ කීහ.

මෙහිදී අදහස් පළ කළ පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා, පසුගිය කාලයේ මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ විශාල සෝදාපාළුවක් දක්නට ලැබුණා. පක්ෂ, විපක්ෂ දේශපාලනඥයන්ට වංචා, දූෂණ, හොර, මැරකම් පිළිබඳව විවිධ චෝදනා ආවා. අපි මේ සම්බන්ධයෙන් අවධානය යොමු කොට රට පුරා විසිර සිටින මහජනතාව, සිවිල් සංවිධාන, උගතුන්, බුද්ධිමතුන් සමඟ සාකච්ඡා කර ගත් තීරණයකට අනුව දේශපාලනයට පිවිසෙන්නකු හට සපුරා ගත යුතු අවම සුදුසුකම් පිළිබඳ ප්‍රකාශනයක් සකස් කළා.

මේ ලේඛනය නාහිමිවරුන් ප්‍රමුඛ ආගමික නායකයන් වෙත ලැබීමට සලස්වා උන්වහන්සේගේ අදහස් හා යෝජනා ආදිය එකතු කොට නැවත සකස් කිරීමෙන් පසුව ලබන මස 12 වැනි දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වෙන මේ පිළිබඳ දනුවත් කිරීමේ අවස්ථාවේදී මේ රටේ දේශපාලන නායකයන් හට එය ලබා දීමට කටයුතු කරනවා. එමඟින් මේ රටේ දේශපාලන ක්ෂේත්‍රයේ යහපත් පෙරළියක් ඇති වේවි කියා බලාපොරොත්තු වෙනවා යැයි කීය.

දේශපාලනයට පිවිසෙන්නකු උදෙසා තිබිය යුතු සුදුසුකම් හා ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ ලේඛනය මල්වතු මහ නාහිමියන් වෙත පිළිගැන්වීම මෙහිදී සිදුවිය.